දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2693869
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NCCP/GOSL/29/2018
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 21 .07.2018
Date )

# සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதாரம், போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

චක්‍රලේඛ ලිපි අංක : 02-176 /2018

සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්

සියලුම ප්‍රාදේශීය සේවා අධ්‍යක්ෂකවරුන්

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් ඇතුළු සියලු ආයතන ප්‍රධානීන් වෙත

## පිළිකා රෝග වැළැක්වීමේ සහ පාලනය කිරීමේ විශිෂ්ටයන් ඇගයීමේ ජාතික උළෙල 2018

බෝ නොවන රෝග අතරින් පිළිකාව ප්‍රධාන තැනක් ගන්නා අතර ගෝලීයව මෙන්ම ශ්‍රී ලංකාවේ ද බෝ නොවන රෝග නිසා සිදු වන මරණ වලට පිළිකාව ප්‍රධාන හේතුවක් වේ. ශ්‍රී ලංකාවේ ජාතික පිළිකා දත්ත ලේඛනයට අනුව පිළිකා රෝගීන් සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවන අතර එය 2010 වර්ෂයේ දී පුද්ගලයන් ලක්ෂයකට රෝගීන් 82.1ක් වාර්තා වී ඇත.

කාන්තාවන්ට වැළඳෙන පිළිකා බහුලත්වයේ අනුපිළිවෙළ පියයුරු, ගැබ් ගෙල, තයිරොයිඩ්, ඩිම්බකෝෂ සහ මුඛ (තොල, මුඛකුහරය හා ග්‍රසනිකාව) පිළිකා වේ. පුරුෂයන්ට වැලදෙන පිළිකා බහුලත්වයේ අනුපිළිවෙළින් මුඛය (ගෙල, මුඛකුහරය, ග්‍රසනිකාව) ස්වසනාලය, ස්වාසනාලිකාව සහ පෙනහලු, ගලනාලය, මහාන්ත්‍රය සහ ගුද මාර්ගය සහ පුරස්ථ පිළිකා ග්‍රන්ථි වේ.

මෙම පිළිකා වලින් බොහොමයක් කල්තබා හඳුනාගැනීම තුලින් වළක්වා ගැනීම හෝ ප්‍රතිකාර මගින් සුව කිරීම සිදු කළ හැකි ය. පිළිකා අතුරින් තුනෙන් එකක් යහපත් සෞඛ්‍ය පුරුදු සහ යහපත් සෞඛ්‍යමත් පරිසරයක් තුලින් වළක්වා ගතහැකි බව පිලිගෙන ඇත. තවත් තුනෙන් එක කල් තියා හඳුනා ගැනීම තුලින් සුව කල හැකි ය. පිළිකා සෑදීමට හේතු වන ප්‍රධාන අහිතකර සාධක අතරින් දුම්කොළ භාවිතය, මද්‍යසාර භාවිතය, සෞඛ්‍යමත් නොවන ආහාර පුරුදු සහ ශාරීරික ක්‍රියාකාරකම් වල නොයෙදීම ප්‍රධාන තැනක් ගන්නා අතර අහිතකර පුරුදු වෙනස් කර ගැනීම තුලින් පිළිකාව වළක්වා ගත හැකි ය.

යම්කිසි පුද්ගලයෙක් පිළිකා රෝගියෙක් යැයි රෝග විනිශ්චය සිදුකල පසු එම රෝගියා හට සහන සත්කාර සේවය සලසා දිය යුතුය. එමඟින් ඔහුගේ ජීවිතයේ ගුණාත්මක භාවය වර්ධනය වේ. සහන සත්කාර සේවය ශ්‍රී ලංකාවේ

පුළුල්ව ස්ථාපිතව නොමැති වුවද රජය විසින් සෞඛ්‍ය සේවකයන් සහ පිළිකා රෝගීන්ට සත්කාර සපයන පුද්ගලයන් අතර සහන සත්කාර සේවය ප්‍රචලිත කිරීමේ පියවරයන් ගනිමින් පවතී.

පිළිකාව වළක්වා ගැනීමේ දී සහ කලින් හඳුනා ගැනීමේ දී, ක්ෂේත්‍ර සෞඛ්‍ය කාර්ය මණ්ඩලය ප්‍රධාන භූමිකාවක් සිදු කරනු ලැබේ. පිළිකාව වැළඳීමට හේතු වන ප්‍රධාන අහිතකර සාධක පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ චර්යාත්මක වෙනස්කම් තුලින් ඉහත සාධක ඉවත් කර පිළිකාව වළක්වා ගත හැක්කේ කෙසේදැයි ඔවුන්ට දැනුම්වත් කිරීම එම ක්ෂේත්‍ර සෞඛ්‍ය කාර්යමණ්ඩලයෙන් බලාපොරොත්තු වේ. තවද සහන සත්කාර සේවා දැනට සිදුකරන්නේ සෞඛ්‍ය ආයතන වල සේවකයන් වුවද අනාගතයේදී මෙම සේවය ක්ෂේත්‍රය තුල ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වේ.

සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පිළිකා වළක්වා ගැනීමේ සහ මර්ධනය කිරීම සම්බන්ධව කටයුතු කරන ජාතික තලයේ ප්‍රධාන ආයතන වන ජාතික පිළිකා මර්දන වැඩසටහන (NCCP) මගින් පිළිකාව වළක්වා ගැනීම, මර්දනය, කලින් හඳුනාගැනීම, ප්‍රතිකාර සේවා සහ සහන සත්කාර සේවා වල, අතිමහත් දුෂ්කරතා මධ්‍යයේ සිදු කළ සේවය නිල වශයෙන් ඇගයීමේ කටයුතු ප්‍රථම වරට ආරම්භ කර ඇත. මෙවැනි ඇගයීම් තුලින් ඔවුන්ගේ සේවයේ ගුණාත්මක භාවය වැඩිකර ගත හැකිය.

ජාතික පිළිකා මර්දන වැඩසටහන මඟින් පිළිකා වළක්වා ගැනීම, මර්දනය කිරීම, ප්‍රතිකාර සේවා, සහන සත්කාර සේවා සලසන ක්ෂේත්‍රයේ සහ සෞඛ්‍ය ආයතන වල කාර්යමණ්ඩල නිල වශයෙන් ඇගයීමේ වාර්ෂික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

මෙහි පළමු උත්සවය 2018 වර්ෂයේ අවසන් කාර්තුවේ පවත්වන අතර ඉහත මාතෘකාවට අදාලව 2017 වර්ෂයේ දී සිදු කළ නිර්මාණාත්මක සහ නැවුම් ක්‍රියාකාරකම් සිදු කළ පුද්ගලයන් / ආයතන තෝරා ඔවුන් අතරින් විශිෂ්ඨයින් ඇගයීමට බලාපොරොත්තු වේ.

මීට අමතරව පිළිකාව මර්දනය කිරීම සහ වළක්වා ගැනීම උදෙසා පිළිකා ආවේක්ෂණ ක්‍රියාකාරකම් වල වැදගත්කම ඇගයීම උදෙසා එම ක්‍රියාකාරකම් වලට දායක වන සියලුම ක්ෂේත්‍රයන්ද ඇගයීමට බලාපොරොත්තු වේ.

එමගින් පහත සඳහන් ක්‍රියාකාරකම් වල විශිෂ්ඨයින්ද ඇගයීමට බලාපොරොත්තු වේ.

1. පිළිකා ප්‍රතිකාර ආයතන තුල සිදුකල ආවේක්ෂණ ක්‍රියාකාරකම්
2. ව්‍යාධිවේදී රසායනාගාර තුළ සිදු කළ ආවේක්ෂණ ක්‍රියාකාරකම්
3. උප්පැන්න, විවාහ සහ මරණ රෙජිස්ට්‍රාර්වරුන් සිදු කරන පිළිකාව නිසා සිදු වූ මරණ ලියාපදිංචි කිරීම වාර්තා කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම්
4. වෛද්‍ය ලේඛන නිලධාරීන් ගේ සේවාවන්

ඉහත ඇගයීමේ කාර්යභාරය තුලින් සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ඇතිවන උනන්දුව නිසා ඉදිරි නිර්මාණාත්මක ක්‍රියාකාරීත්වයන් වැඩිදියුණු වේ යැයි බලාපොරොත්තු වෙමු.

**<u>යෝජනා ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය (මාර්ගෝපදේශනය)</u>**

**උත්සවයේ අරමුණ**

පිළිකා වළක්වා ගැනීම, කලින් හඳුනා ගැනීම, ප්‍රතිකාර සේවා සපයන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සහ පිළිකා ආවේක්ෂණ කටයුතු වල නියැලෙන සෞඛ්‍ය සහ සෞඛ්‍ය නොවන කාර්යමණ්ඩල විසින් සිදු කරන ලබන නිර්මාණාත්මක සහ නැවුම් ක්‍රියාකාරකම්/ භාවිතයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා ඔවුන්ගේ දායකත්වය ඇගයීමට ලක්කිරීම.

**ඇගයීම් කාණ්ඩයන්**

ප්‍රධාන කාණ්ඩ 2ක් යටතේ ඇගයීමට බලාපොරොත්තු වේ.

කාණ්ඩය I

1. තනි පුද්ගල හෝ කණ්ඩායම්

තනි පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින් සිදුකල ඉහත ක්‍රියාකාරකම්

කාණ්ඩය II

2. ආයතන

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල/ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල/ පලාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල/ රෝහල් හෝ වෙනත් ඕනෑම සෞඛ්‍ය ආයතනයකට මෙම කාණ්ඩය යටතේ යෝජනා ඉදිරිපත් කළ හැකිය.

එකී ක්‍රියාකාරකමක් සඳහා යෝජනා ඉදිරිපත් කල හැක්කේ එක් කාණ්ඩයක් යටතේ පමණි.

**<u>යෝජනා ඉදිරිපත් කිරීමට අවශ්‍ය සුදුසුකම් හා නිර්ණායක</u>**

- රජයේ සෞඛ්‍ය ආයතනයක සේවය කරන නිලධාරියකු/ නිලධාරිණියක හෝ නිලධාරීන් හෝ සේවක මණ්ඩලය විසින් අදාල ක්‍රියාකාරකම 2017 වර්ෂය තුලදී උත්සවයේ අරමුණ මූලික කර ගන්මින් සිදුකල ක්‍රියාකාරකමක් විය යුතුයි.
- ඉහත සඳහන් අයවලුන් පිළිකාව වළක්වා ගැනීමේ හෝ ප්‍රතිකාර කිරීමේ අංශයකට අයත් විය හැකි ය.
- යෝජනා ඉදිරිපත් කරන්නේ පිළිකා ආවේක්ෂණ කටයුතු වලට සම්බන්ධව නම් ඉහත සඳහන් කාණ්ඩ වලට අමතරව විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.
- ක්‍රියාකාරකම් හො ව්‍යාපෘතියේ අරමුණ සෞඛ්‍ය ප්‍රවර්ධනය, පිළිකා වළක්වා ගැනීම, කලින් හඳුනාගැනීම, ප්‍රතිකාර සේවා, සහන සත්කාර සේවා ක්‍රමවේද හෝ පිළිකා රෝගීන්ගේ දත්ත වාර්තා කිරීම සම්බන්ධව විය යුතු ය.
- ක්‍රියාකාරකම් හෝ ව්‍යාපෘතිය නිර්මාණාත්මක නව ක්‍රියාකාරකමක් විය යුතු අතර එය දැනට භාවිතා කරන දෛනික ක්‍රමවේදයට බාහිර ව සිදු කල ක්‍රියාවක් විය යුතු ය. නොඑසේනම් දැනට භාවිතා වන ක්‍රමවේදයක් නවමු ආකාරයක සිදු කරන ක්‍රියාවලියක් වියයුතුය. තවද පිළිකා මර්දනය සංක්ෂිප්ත වශයෙන් ඉහල තලයකට ගෙන ඒම පිණිස මහත් කැපකිරීමෙන් සිදුකල ක්‍රියාවක් විය යුතුය.
- නිලධාරියකු/ නිලධාරිණියක/ හෝ ආයතනයකට යෝජනා එකකට වඩා ඉදිරිපත් කල හැකි අතර එම ක්‍රියාකාරකම් වෙන වෙනම යෝජනා ලෙස ඉදිරිපත් කල යුතුය.

**විශිෂ්ටතා ඇගයීමේ ක්‍රමවේදය**

එක් එක් කාණ්ඩයන් යටතේ ජාතික තලයේ විශිෂ්ටතම යෝජනා 3ක් තෝරාගනු ලැබේ. පලාත් මට්ටමින්ද ඉහත කාණ්ඩ 2ක යටතේ විශිෂ්ටතම යෝජනා 3ක් දක්වා තෝරා ගැනීමට බලාපොරොත්තු වේ.

- මීට අමතර ජාතික තලයේ සහ පලාත් මට්ටම් කුසලතා ඇගයීම් පිරිනැමීමට බලාපොරොත්තු වේ.
- සුදුසුකම් ලත් විශේෂඥ මණ්ඩලයක් මගින් පෙර සකසන ලද ක්‍රමවේදයකට අනුව විශිෂ්ඨතා ක්‍රියාකාරකම් තෝරා ගැනීම සිදු කරනු ලබයි.
- තේරීම් මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ

තොරතුරු සන්නිවේදනය

- ජාතික තලයේ විශිෂ්ඨ ක්‍රියාකාරකම් උළෙල පවත්වන අවස්ථාවේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙනු ඇත.
- තෝරා ගැනීමේ ක්‍රමවේදයට අනුකුලව තෝරා ගත් විශිෂ්ට ක්‍රියාකාරකම් ඉදිරිපත් කරන ලද යෝජනා පොතක් වශයෙන් මුද්‍රනය කර ප්‍රසිද්ධ කරනු ලැබේ.

**ලිඛිත යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මාර්ගෝපදේශය ( ක්‍රමවේදය)**

අදාල යෝජනාව සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ලිඛිතව ඉදිරිපත් කල හැකිය.

- එම යෝජනාව ක්‍රියාකාරකමේ මාතෘකාව , කතෘගේ නම, තුතිපිදීම හැරුණුවිට වචන 500ට නොවැඩි විය යුතු අතර උපරිම වශයෙන් දත්ත වගු 2ක් අඩංගු කල හැකිය.
- අදාල යෝජනාවේ පහත අංග ඇතුලත් විය යුතුය

**මාතෘකාව**

ක්‍රියාකාරකම පැහැදිලිව නිරූපනය කරන්නක් විය යුතුයි

**කර්තෘ**

තනි පුද්ගල කාණ්ඩයේ යෝජනාවල කර්තෘ තනි පුද්ගලයකු විය යුතුය. අනෙකුත් යෝජනා තනි පුද්ගල කර්තෘ නාමයකින් හෝ ඊට වැඩි ගණනකගේ නම් වලින් ඉදිරිපත් කල හැකිය. ක්‍රියාකාරකමට ඇතුලත් වූ සියලු ප්‍රධාන පුද්ගලයෙකුගේ නාමය කර්තෘ ලෙස ඇතුලත් විය යුතුය. නම සහ රාජකාරී ස්ථානය පහත පරිදි සඳහන් කල යුතුය.

නම, තනතුර, සේවා ස්ථානය

උදාහරණ :

සමන් තෙන්නකෝන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, කොහුවල

**හැඳින්වීම**

පිළිකාව, වළක්වා ගැනීම, මර්දනය, ප්‍රතිකාර, සහන සත්කාර සේවා හෝ ආවේක්ෂණ කටයුතු වලට අදාලව ඔබගේ යෝජනාව අනුකුල වන්නේ කෙසේදැයි ඉදිරිපත් කල යුතුය.

**අරමුණ**

ක්‍රියාකාරකම් හෝ ව්‍යාපෘතියේ අරමුණ හෝ අරමුණු

**ක්‍රමවේදය**

ක්‍රියාකාරකම සිදු කළ ආකාරය පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කල යුතුය

**ප්‍රතිඵලය**

මෙම ක්‍රියාකාරකම හෝ ව්‍යාපෘතිය මගින් ලබාගත් ප්‍රතිඵලය/ ප්‍රතිඵල සඳහන් කල යුතුය.

**සාකච්ඡාව**

ඉහත ක්‍රියාකාරකමෙන් හෝ ව්‍යාපෘතියෙන් ලබාගත් ප්‍රතිඵල ශ්‍රී ලංකාවේ පිළිකාව නිසා සිදු වන ගැටලුකාරී තත්වයන් සමනය කිරීමට දායකවන්නේ කෙසේදැයි විස්තර කර එය අඛණ්ඩව පවත්වා ගන්නේ

කෙසේදැයි පැහැදිලි කිරීම හා ඉහත ක්‍රියාකාරකම හෝ ව්‍යාපෘතිය සිදුකරන අනතුර මුහුණ දුන් අපහසුතා හා බාධක පිළිබඳ විස්තරයක්.

**ස්තුතිය**

අදාල ව්‍යාපෘතිය හෝ ක්‍රියාකාරකම සිදුකිරීමේදී උපකාර කල කතෘ වශයෙන් සඳහන් නොකල වෙනත් සඳහන් කලයුතු පුද්ගලයන්ගේ නාම.

**සාක්ෂි**

අදාල ව්‍යාපෘතියට අදාල ඇති ලියකියවිලි හා ඡායාරූප ඇමිණිය යුතුයි.

**අයදුම් කරන ආකාරය**

පහත ආකෘති පත්‍රය පුරවා නියමිත පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ රැගෙනවිත් පහත ලිපිනයට භාර දෙන්න.

**පිළිකා රෝග වැළැක්වීමේ සහ පාලනය කිරීමේ විශිෂ්ටයන් ඇගයීමේ ජාතික උළෙල 2018**

**ජාතික පිළිකා මර්දන වැඩසටහන,**

**මහජන සෞඛ්‍ය සංකීර්ණය,**

**අංක 555/5, ඇලිවිටිගල මාවත,**

**කොළඹ 05**

**ශ්‍රී ලංකාව**

ව්‍යාපෘතියට අදාල යෝජනාව ඉදිරිපත් කලයුතු විද්‍යුත් තැපෑල: nccp@health.gov.lk or director.nccpsl@gmail.com

වැඩිදුර තොරතුරු සඳහා පහත දුරකතන අංකයට අමතන්න: 0112 368627

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**වෛද්‍ය අනිල් ජාසිංහ**

**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්**

**පිටපත්**

සියලු නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්වරු

අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්දන වැඩසටහන

අධ්‍යක්ෂ, බෝනොවන රෝග

අධ්‍යක්ෂ, දන්ත වෛද්‍ය සේවා

අධ්‍යක්ෂ, මානසික සෞඛ්‍ය

අධ්‍යක්ෂ, ප්‍රාථමික සේවා

අධ්‍යක්ෂ, පවුල් සෞඛ්‍ය කාර්යාංශය

පළාත් ප්‍රජා වෛද්‍ය විශේෂඥ නිලධාරීන්, පළාත් ප්‍රජා දන්ත වෛද්‍ය විශේෂඥ නිලධාරීන්

ප්‍රධාන වෛද්‍ය නිලධාරීන් (පාසල් සෞඛ්‍ය)

සියලු ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්

සියලු වෛද්‍ය නිලධාරීන් ( බෝනොවන රෝග )

සියලු වෛද්‍ය නිලධාරීන් ( මාතෘ හා ළමා සෞඛ්‍ය )